"අපේ කමට" ජගත් සම්මාන !

සිසිර දිසානායක

ටෙක්ස් පණිවිඩයක් !

"අයියේ අපි චීනෙට යනවා.... සහන්."
සිංහිරිසියෙන් ලියැවිලා.

එදා අපි හිතුවෙ රන්වල ජනගී කණ්ඩායම චීනෙට යන්නේ ප්‍රසංගයකට කියලා. ඉතින් අපි සුපුරුදු විදියට සුභ පැතුවා.

"වස්"මදුය් ව්එය්බඅ් ඊ්අ්එයසබප් ඉ

"අපි සුභ පතනවා, හදවතින් ම !"

ඒ අගෝසතු 31 වෙනිදා.

"සහන්ලා ජාත්‍යන්තර ජන ගී තරඟයකින් පළවැනි තැනට ඇවිල්ලලු නේද ?" ඒ ආරංචිය ලැබුණෙ සැප්තැම්බර් 18 වෙනිදා.

"ඔව් අයියේ. මේ උත්සවයේ අන්තිම දවස වෙනකල්ම අපි දැනගෙන හිටියෙත් නෑ මේක තරඟයක් බව. අපි හිතුවෙ අපේ ජනගී ජාත්‍යන්තර වේදිකාවක පෙන්නන්න ලබා දුන්න හොඳ අවස්ථාවක් විදියට. හොඳම කණ්ඩායම් තෝරන බවක් දැනගෙන හිටියෙ නෑ. ඒබ ව සංවිධායකයෝ ප්‍රකාශයට පත් කළේ අන්තිම දවසේ පැවැත්වුණ උත්සවයෙදී. මොනවා වුණත් අපි ඉතින් උපරිමයෙන් ම කළා..." රන්වල පදනමේ ජනගී කණ්ඩායම වෙනුවෙන් සහන් රන්වලයන් අපට දුරකථනයෙන් එකතු වුණා.

"කවද ද ආවෙ ?"

"ඊයේ ආවෙ අයියෙ. ටිකක් මහන්සි. ඒ වුණාට ඔයාලට මේ දේවල් කියනකොට මහන්සියක් දැනෙන්නෙ නෑ. අපිව පිළිගන්න රජයේ සංස්කෘතික හා කලා කටයුතු පිළිබඳ අමාත්‍යංශයේ ලේකම්තුමා කලා කටයුතු පිළිබඳ අධ්‍යක්ෂතුමා කලා කටයුතු පිළිබඳව ජනාධිපති සම්බන්ධීකරණ ලේකම්තුමා වගේ කණ්ඩායමක් කටුනායක ගුවන්තොටට ඇවිත් හිටියා. ඒ වගේම මම ඉගෙන ගත්ත කොළඹ ආනන්ද මහා විද්‍යාලයේ විදුහල්පති තුමාත් ඇවිත් මල්මාලා දමලා අපිව පිළිගත්ත එක විශේෂයක්. අපේ තාත්තා වැඩි කාලයක් අන්තිමට ඉගැන්නුවෙත් ආනන්දයේ නේ. රාජ්‍ය නැටුම් කණ්ඩායම තමයි අපිව පිළිගන්න නැටුම් ඉදිරිපත් කළේ..... සහන්ගේ පියතුමායි ලයනල් රන්වලයන්.

"ඉතින් ඇත්තටම මොකක්ද මේ උත්සවේ ?"

"මේක නම් කරලා තිබුණේ " 2011 ජාත්‍යාන්තර ජන සංගීත සතිය" කියලයි. පැවැත්වුණේ චීනයේ " රැන්පියාපී" කියන නගරයේ. සැප්තැම්බර් දහවෙනිදා ඉඳන් දාසයවෙනිදා වෙනකල් සතියක් පුරාම අපිව අපේ ප්‍රසංග ඉදිරිපත් කරන්න වුණා. ඇත්තටම ඒවා චිනාඩි පහළොවේ කෙටි ප්‍රසංග. ධවසකට ඒ වාගේ ප්‍රසංග දෙක ගානේ සතියෙම කෙටි ප්‍රසංග දාහතරක් විතර ඉදිරිපත් කළා. මේවා එකකට එකක් වෙනස් ප්‍රසංග. ලෝකය පුරා රටවල් විසි අටකින් කණ්ඩායම් තිස් නවයක් ඉදිරිපත් වෙලා තිබුණා. ඒ ඇරෙන්න චීනයේ කණ්ඩායම් විසි එකක්. ඉතින් ඔක්කොම කණ්ඩායම් හැටක් විතර. ඇත්තට ම අයියේ මේ කණ්ඩායම් අතරින් හොඳම කණ්ඩායම් හය තමයි තේරුවේ. එකකට එකක් වෙනස් තිසා

සන්සන්දනය කරන්න අමාරුයි. ඒ නිසා පළවෙන-යා, දෙවෙනියා, තුන්වෙනියා තේරුවේ නෑ. ඒ කණ්ඩායම් හය තමයි ඇමරිකාව, රුසියාව, ශ්‍රී ලංකාව, ප්‍රංශය, ජෝර්පියාව, දකුණු අප්‍රිකාව කියන රටවල්වල කණ්ඩායම්. ආසියාතික රටකින් තේරුනේ අපේ කණ්ඩායම විතරයි. ඉතින් ඒ අනික් ලොකු රටවල්වල කොඩි අතරේ අපේ පුංචි රටේ කොඩියත් එසවුණා. ජාතික ගීතය වාදනය වුණා. ඇත්තටම කියනවනම් අපට සටනක් දෙන්න හිටියේ ජෝර්පියාව විතරයි. ඒත් අපේ ඉදිරිපත් කිරීම්වලට වඩා ඒ අයගේ කෙටි ප්‍රසංග ඒකාකාරියි.

ලාබාලම කණ්ඩායමත් අපියි. අපේ අය අතරේ අවුරුදු විස්සක් වයස මල්ලි කෙනෙකුත් හිටියා. අපේ කණ්ඩායමට මම, දිලුම් තිරංජ්, පසිඳු චාමර, හර්ෂදේව කාලිංග, නිළිණ අදිකාරම්, ඉසුරු බියගමගේ, ප්‍රසාද් මංජුල, නිරෝෂ ප්‍රියදර්ශන, අචිනි ලක්මාලි, නිලුපුල් මධුරංගා කියන දහදෙනා ඇතුලත් වුණා.

ලංකාවේ රාජ්‍ය සංගීත උළලේ "හොඳම ජන ගී ගායකයා විදියට තේරුණේ දිලුම් තිරංජ්, පසිඳු චාමරට ජන ගී නිර්මාණ වෙනුවෙන් කුසලතා සහතිකයක් ලැබුණා. ඇත්තටම හැම අතින්ම හපන්කම් පෙන්නන අපේ ජ්‍යෙෂ්ඨයා ප්‍රදීප් මුතුකුඩආරච්චිට විසා ප්‍රශ්ණයක් නිසා සහභාගි වෙන්න බැරිවුණා. කණ්ඩායමට අමතරව සංස්කෘතික අමාත්‍යංශයේ ආර්.ඒ.ඩබ්ලිව්. පෙරේරා මහත්මයාත් සවිනිකා සුමතිපාල මහත්මියත් නිලධාරීන් හැටියට අපිත් එක්ක ගියා. ලස්සන වැඩේ කියන්නෙ ආර්.ඒ.ඩබ්ලිව්. පෙරේරා මහත්මයා අපේ සමහර අංගවලට පුහුණු වෙලා අපට එකතු වුණා. අයියා ලියපු " කහමලියා" සින්දුවේ විදානෙරාළගෙ චරිතයට රඟපෑවේ ඒ මහත්තයා."

මලල ක්‍රීඩකයින් කිප දෙනෙකු සහභාගිවන ක්‍රීඩා උත්සවවලට බුරුතු පිටින් නිළධාරීන් පිටරට යැදී සංස්කෘතික අමාත්‍යංශයන පෙන්වා ඇත්තේ අපූරු ආදර්ශයක්. ඉතින් ? ඉතින් ??

අපි මේක තරඟයක් කියලා දැනගෙන හිටියෙ නැතත්, අනික් අයගේ දේවල් දකිනකොට අපි ඊට වඩා වෙනස් දෙයක් කරන්න ඕන කියලා හිතුවා. දැන් තොවිලයක අංග ටිකක් චිනාඩි පහළොවට එකතු කළත් පොඩි ඒකාකාරි බවක් ඒ චිනාඩි පහළොවෙත් දැනෙනවානේ. ඒ හන්දා චිනාඩි පහක් විතර එකතු කළා. එවේලේ නිර්මාණය කරගත්ත අංගත් ඒ ඒ වෙලාවෙ හැටියට රිංගෙව්වා. දරු නැළවිල්ලක් කිව්වට පස්සේ, තොවිල් නැටුම් අංගයක්. ඊට පස්සෙ නෙළුම් කවි; ඊ ළඟට බෙර වාදනයක්,.... ඔය වාගේ. සමහර පුරුදු අංගවල පුරුදු චරිත වෙනස් කළා. දැන් ඔයා ලියපු " ගම අවුලංසඳ්සදං" සින්දුවේ මැගී නැන්දාගේ චරිතය වෙනුවට අපි කළේ "කළු මාමා" කියලා චරිතයක්. අපේ සීමිත නලු නිළියන් අංග රචනයට ඕන කරන දේවල් උපරිම විදියට යොදා ගත්තා.

වෙස් ගන්වන්න ඕන කරන දේ විතරක් නෙවෙයි, ඇඳුම් ආයිත්තම්, උඩරට, පාතරට බෙර, දවුල්, තම්මැට්ටම්, රබන්, හොරණෑ වාගේ අපේ භාණ්ඩ වගේම අනික් සංගීත භාණ්ඩ එහෙමත් ගෙනිච්චා. අයියත් දන්නවානේ ගායනය විතරක් නෙවෙයි රංගනය, නර්ථනය, කථනය, අභිණය, වාදනය, අංග රචනය, පිටපත් රචනය, ගීත රචනය, තනු නිර්මාණය වගේ හැම දේකට ම හපන්නු අපි අතරෙ ඉන්නවා කියලා. ඒ අයගෙන් හැම දේටම හපන් දහදෙනෙක් තමයි ගියේ. තරඟයෙන් කෙටි ප්‍රසංගවලට අමතරව හැමදාම රෑට සුභදව කරපු ඉදිරිපත් කිරීම් තිබුණා. ඒවායේදීත් අපේ ඉදිරිපත් කිරීම් අනික් හැමෝගෙම අවධානය ගන්න හේතු වුණා. මුලදි ශ්‍රී ලංකාව කියන්නේ කවුරුවත් දන්නෙත් නැති කණ්ඩායමක්. අන්තිම වෙනකොට අපි අනික් අයට වඩා සැහෙන්න ඉදිරියෙන් හිටියා. මේ තරම් විවිධාකාර වුන් ජන සංගීතයක් තිබෙන එක ගැන ඒඅ ය පුදුම වුණා. ඒ නිසා ම නිල නොවෙති පළවැනියෝ බවට අපිව ඉබේ ම පත්වුණා.

අපේ අයගේ හපන්කම් ඒකට හේතු වුණා. දැන් උදාහරණයක් ගත්තොත්, ඒ රෑට කරපු සුභද ඉදිරිපත් කිරීම්වලදී අනික් අය වාදනය කරලා පෙන්නපු ඒ අයගේ හැම බෙර පදයක් ම අපේ අය ඊට වඩා හොඳට වාදනය කර පෙන්නුවා. ඒත් අපි වාදනය කරලා අභියෝග කරපු අපේ බෙර පද එකක්වත් ඒ අයට වාදනය කරන්න බැරි වුණා. ඒකට හේතුව අපේ බෙර පද වාදනයට ශිල්පීය පද ක්‍රමයත් තියෙනවා. අනික් අයගේ ඒවා නිකම් තාලයට තට්ටු කරන පද විතරයි. භාණ්ඩයේ වෙනසයි තට්ටු කරන ක්‍රමයයි තමා වෙනස් වෙන්නේ. අපේ අයට තියෙන අර ශිල්පීය හුරුව හන්දා ඒ අයගේ පද අල්ලාගන්න එක අමාරු නෑ.

සතිය පුරා පැවැත්වුණ කෙටි ප්‍රසංගවලදීත් අපට ලැබුණේ ඉහළම ප්‍රතිචාර. අපේ වෙස් ගැන්වීම්වලටම ඒ අයට හරියට හිනායනවා. වේදිකාවට එනකොටම ප්‍රේක්ෂකාගාරය හිනාවෙන් ඉතිරෙනවා. අපිත් ඉතින් විවිධාකාර වුන ගමන් රටා, හැසිරීම්, වෙස්මුණු, රැවුල් " කොණ්ඩ, ඔළු බක්කෝ වගේ දේවල් ඉදිරිපත් කළා.

ටැන්ජ්යාපි නගරය තියෙන්නේ "ඇවෙටා" චිත්‍රපටියෙ කඳුකර දර්ශන ගත්ත ප්‍රදේශයේ. හරිම ලස්සනයි. සතිය අන්තිමට අවසන් උත්සවය පැවැත්වුනේ ඒ නගරයේ "යෙලෝ ඩ්‍රැගන් කේව්" :ශැකකඳඅ ඉරිටදබ ඊඩැ* කියන ජාත්‍යන්තර රංග ශාලාවේයි. ඉතින් මේක තරඟයක් බවත්, තරඟයෙන් තෝරා ගත් කණ්ඩායම් හයට අපි ඇතුළත් වුණ බවත් කිව්වම ඇත්තට ම අපිට අදහාගන්න බැරි වුණා. අපේ සංස්කෘතික අමාත්‍යංශයෙන් තරඟයට තෝරා ගන්න ඉදිරිපත් කරපු ලංකාවේ කණ්ඩායම් කීයයකගේ දර්ශන පටි බලලා, අපිව තෝරාගෙන, අපිට ආරාධානා කළේ චීනයෙන්. ඒ මොහොතේ ඉඳන් සම්මාන ලබලා ජාතික කොඩිය හෙවනේ ජාතික ගීය ඇහෙන මොහොත වෙනකල්ම අපට හීනයක් වගේ. හැබැයි ඒ හීනය පිටිපස්සේ අපේ ජන ගීයේ අපූර්වත්වයයි, අපේ කණ්ඩායමේ හැකියාව " කැපවීම " පුහුණුව වගේ දේවලුයි තියෙනවා....."

සහන් රන්වලයන් තමන්ගේ දීර්ඝ දුරකථන කතාව ඉවර කළා. ඇත්තටම මේ දේට කණ්ඩායමේ පන්තරය ලැබුවෙ, "අගසෙ ඉන්නවලු" , "ගම අවුලංසඳ්සදං", "ගුද්ධෙටත් ඇවිත", " පුංචි අයට ජන ගී", "ත්‍රි" වාගේ ප්‍රසංගවලින්. දර්ශන වාරගණනින් වගේම ප්‍රේක්ෂක සහභාගිත්වයෙන් "ගම අවුලංසඳ්සදං" ප්‍රසංගය දෙවෙනි වෙන්නේ වික්ටර් රත්නායකයන්ගේ "ස" ප්‍රසංගයට විතරයි.

තමන්ගේ දේ ගැන වැටහීමක්, වටිනාකමක් නැතිකමේ අවාසනාවෙන් " වැහිලා ඉන්න අපේ ම සමහර අයට හොඳ පාඩමක් මේ. අපේ ජනගීය ගැන පුරෝගාමී වෙලා කටයුතු කරපු දිවංගත ඩබ්ලිව්. බී. මකුලොලුව මහත්තයාගේ පාරේ යමින් උනන්දුවෙන් කැපවුන ලයනල් රන්වලයන් පටන් ගත්ත රන්වල පදගම, ඒ මහත්මයාගේ වියෝවෙන් පස්සේ ඉස්සරහට අරගෙන ආවේ සහන් රන්වල පුතනුවන්. අදඅ පි මේ කතා කළේ ඒ ආ ගමනේ උත්තරිතර අවස්ථාවක් ගැන. ශ්‍රී ලංකාවේ හෙළ ජන සංගීතය මෙතරම් ඉහළින් අගය කෙරුණ වෙනත් අවසථාවක් නැති තරම්. ඉතින් ඒ දේ කළ රන්වල පදනමේ ජන ගී කණ්ඩායමට අපේ උණුසුම් සුභ පැතුම් !